## අමද්‍යප ව්‍යාපාරයේ ගමන්මඟ සහ අනගාරික ධර්මපාලතුමා

ඩී. දිලානි නිරෝෂිනී ද සිල්වා
*ronetsolutions@gmail.com*

සිංහලයා බීමතට හුරු නොවූ පිරිසක් ලෙස රොබට් නොක්ස් සිය දින පොතෙහි සටහන් තැබූවත් "ලංකාවේ ගමක් ගමක් පාසා රා තැබෑරුම් විවෘත කළ යුතු ය" යන අදහසින් 1912 සුරා බදු ව්‍යවස්ථාව ඒක ඡන්දයෙන් සම්මත කිරීමට වූයෙන් සිංහලයා සුරාවට ලොල් පිරිසක් බවට පරිවර්තනය කිරීමට ඉංග්‍රීසීන්ට හැකි වීම ජාතියේ ව්‍යසනයකට මුල පිරීමක් විය.

"ගන්නා රේන්දය මත්පැන් විකිණීමට
පෙන්නා දී ඒ මහතුන් හට වෙන ගැහැට
පන්නා හැරියහොත් රේන්දය මෙලක සිට
දුන්නා වැනි දෙව්ලොව අත්කර යසට"
සිංහල බෞද්ධයා 1921

අරක්කු සහ රා අලෙවි කිරීමේ අවසරය බදු වෙන්දේසි ක්‍රමය යටතේ වැඩි මිලකට බලපත්‍රය හිමි කරගත් ගැනුම්කරු ඉංග්‍රීසියෙන් රෙන්ටර්ස් (renters) ලෙස හැඳින්විය. සිංහල ව්‍යවහාරයෙන් "රේන්දකාරයා" නම් විය. දහනව වන සියවසේ රාජ්‍ය ආදායමෙන් 10% ක්, 15% පමණ ලබා ඇත්තේ අරක්කු රේන්දයෙනි. මෙසේ රේන්දකරුවන් සමාජයේ ධනවත් ව්‍යාපාරික ප්‍රජාවක් ලෙස ස්ථාපිත විය.

ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් විසින් මද්‍යපානය නිසා ඇති වන සමාජ පරිහානිය අංශ කිහිපයක් ඔස්සේ විවේචනය කරමින් 'සිංහල බෞද්ධයා' පුවත්පතින් සමාජය දැනුවත් කරන ලදි. එතුමා විසින් බොහෝ දෑ විග්‍රහ කරන්නට වූයේ ජාතියේ ගැලවුම්කරු ලෙස තමන් ඉදිරිපත් වූ අයුරු විමසුම් ඇසින්, විචක්ෂණ බුද්ධියෙන් සිංහලයාට දැකීමට අවස්ථාව උදා කරමිනි. විස්කි, බ්‍රැන්ඩි, අරක්කු, වයින් බීමට හා සත්ව ඝාතනයට මිථ්‍යා දෘෂ්ටික ගුරුවරුන්ගෙන් උගත් සිංහලයාගේ පිරිහෙන්නට වූ උතුම් සදාචාර ධර්මයන් යළි ඔවුන් තුළ ගොඩ නැංවීම ධර්මපාලතුමාගේ අමද්‍යප සටනේ ඒකායන අරමුණ විය. යුරෝපීය ජාතිය පරවර, හම්බ, බොම්බකාර පරදේශිකයන් ද යුරෝපීය සුරාව ද සිංහලයන්ගේ සතුරන් ලෙස හඳුන්වා දී තිබීමේ යථාර්ථය එදා නිසි ලෙස හඳුනා නොගත්තද වර්තමානය දෙස බලා තීරණයක් ගැනීම ඔබ සතු වගකීමකි.

මත්පැනට හුරුවීම දුරාචාර බොහොමයක ආරම්භයක් විය. ඊට හුරුවීම තුළ පන්සිල් රැක ගත නොහැකි වූ බෞද්ධයා කෙරෙහි එතුමා දැඩි කළකිරීමට පත් විය. පවුල තුළ දෙමාපිය, දූදරු, ස්වාමිපුරුෂ, භාර්යා යන එකිනෙකාගේ යුතුකම් වගකීම් ගිලිහී යන්නට වූයේ සිදු වන ව්‍යසනය වැළැක්වීමට කිසිවෙකුට ඉඩ නොතබමිනි.

යටත් විජිත සමය තුළ නීත්‍යානුකූල සුරා සැල් විවෘත වීම තුළ සුරා සැළ සමාජ සංස්ථාවේ තවත් එක් ආයතනයක් බවට පත් විය. කටගැස්මක් සහිතව මත්පැනට ලොල් වීමේ ප්‍රතිඵලයක් ලෙස ගව මස් අනුභවය සමාජ අංගයක් වූයේ ගවයාගේ ජීවත් වීමේ අයිතිය උදුරා ගනිමිනි. කෘෂි සංස්කෘතිය තුළ ගවයා විශේෂ කාර්යභාරයක් ඉටු කරනු ලැබූවෙකි. මේ නොහොබිනා සංස්කෘතික රටාව නිසා ධර්මපාල තුමාගේ සටන් පාඨය 'මත්පැන් නොබොනු! ගවමස් නොකනු!' ලෙස විය. මත්පැන් පිරිමින්ට පමණක් සීමා නොවී ස්ත්‍රී පාර්ශ්වයට ද විතැන් වීම පසුකාලීනව සිදුවිය. වර්තමානය වන විට මව හා පියා දෙදෙනාත් දරුවනුත් සමාජශාලා දෙසට රොක් වනුයේ 'පවුල' නැමැති ඒකකයේ සමාජ වගකීම පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති වීම නිසා බව කනගාටුවට කරුණකි.

ප්‍රේතාකාරයට, සුනඛාකාරයට, රාක්ෂයාකාරයට, සූකරාකාරයට සුරා පානය කළ අය දැකගත හැකි බව සිංහල බෞද්ධයා පුවත්පතේ දක්වා තිබීම කොතරම් සාධාරණ දැයි සැමට වැටහෙනු ඇත. සිංහලයන් ස්වභාවයෙන් ම ප්‍රචණ්ඩකරුවන් නොවූවත් මත්පැන නිසා දෘෂ්ට මිනීමරුවන් බව බෞද්ධ පරම විඥානාර්ථ සමාගම පල කළ සරසවි සඳරැස පුවත්පතේ සඳහන් බව දිසානායක (2012) සිය පරිවර්තන කෘතියක දක්වා ඇත.

මද්‍යපානය, ආර්ථිකය ප්‍රබල ලෙස විනාශ කරන මාරකයක් වීම ධර්මපාලතුමාගේ අමද්‍යප සටනට තේමා පාඨයකි. සිංහල මනුෂ්‍යයාගේ පිරිහීමට ප්‍රධාන හේතුව මද්‍යපානය බවත් එය හලාහල විෂක් ලෙස ප්‍රතික්ෂේප කරන ලෙස තරයේ ම සිතට ගත යුතු බවත් එතුමාගේ අවවාදය විය. "හම්බ මරක්කල නාටුන්ට මත්පැන් නොබී ඉන්ට පුළුවන්නම් සිංහලයාට බැරි මන්ද?" යනු එතුමා නැගූ පැනය යි. සාමාන්‍යයෙන් ආගමෙන් පැනවූ තහංචි නිසා මුසල්මානුවා මද්‍යපානය ප්‍රතික්ෂේප කරයි. නමුත් වර්තමානයේ ලංකාවේ සුරාසැල් ව්‍යාප්තිය දෙස අවධානයට ලක් කිරීමේ දී එහි වර්ධනයේ ඉහළයාම පැහැදිලිව හඳුනාගත හැක.

> "ඒ උතුම් සිංහල ජාතිය දියුණු කිරීමට නොහැකි වී තිබෙන්නේ මන්ද?
> අඥානකමක්, බීමත්කමත්, ලෝක නීතිය නොදැනගැන්මත් නිසා සිංහලයා පහත බැස ඳ තිබේ.
> වර්ෂයකට සිංහල උදවිය උම්බලකඩ කෑමට රු. තිස් ලක්ෂයක් වියදම් කරන්නේය.
> රා අරක්කු බීමට රු. එක්කෝටි හතලිස් ලක්ෂයක් වියදම් කරන්නේය.
> සිංහල උදවිය උම්බලකඩ හා මත්පැනට කරන වියදම නවතා ජාතිය වර්ධනය

කිරීමට තැන්පත් කරයි නම් දොළොස් මසකින් අපේ රට දිව්‍ය ලෝකයක් හා සමාන කළ හැකිය. මත්පැනට වියදම් කරන මුදල
තැම්පත් කිරීමට වීර්ය කරනු." - සිංහල බෞද්ධයා .1912

සුරාවට ලොල් වීම ජාතික ආර්ථිකයේ ප්‍රබල ව්‍යවසනයක් බව අනාගතය දුටු ධර්මපාල තුමා දැඩි ලෙස අවධාරණය කළ සත්‍යයකි. රා අරක්කු පානය නොකොට මාංශ භක්ෂණයෙන් තොරව ශිල්පාදිය දරුවන්ට ඉගැන්වීම ගැන ජාතියේ අවධානය යොමු කිරීම ඔහුගේ අවවාදය විය. එසේම සකසුරුවම ඉස්මතු කිරීමට අමතක කර නැත. දිවයිනේ නන් දෙස්හි අමද්‍යප සමාගම් මගින් සාමාජිකයාගේ ආදායම පාලනය කරන වගකීම ගත්තේ මාසිකව ඉතිරි කිරීමේ පුරුද්දක් අරඹමිණි. වරක් මත්පැන් පානයෙන් වැළකුන සැමියන් ඉතිරි කළ මුදලින් මිලට ගත් වස්ත්‍රාභරණ පිරවූ බන්දේසි හිසින් ගෙන කොළඹ නාගරික කාන්තාවන් පෙරහැරෙන් ගමන් කර ඇති බව වාර්තාවල සඳහන්වී තිබේ.

වර්තමාන රෝහල් සංඛ්‍යා ලේඛන පරීක්ෂාවෙන් මෙහි උච්චතම තත්ත්වයන් මෙහි බුද්ධියට හසු කර ගත හැකි වනු ඇත. රජයක් විසින් සුරා බදු ආදායම්, දුම්වැටි බදු ආදිය ඉහළ මට්ටමින් ලබන විට ඉන් සිදු වූ හානිකර තත්ත්වයන් සැඟවීමට විකෘති කිරීමට දරන මුදල් ප්‍රමාණය කොපමණක් වන්නේ දැයි නැවත නැවත සිතා බැලිය යුතුය.

අරක්කු බදු කාර්යයන් ලෙස බිහි වූ ව්‍යාපාරික මධ්‍යම පන්තිය බෞද්ධ පුනරුද ව්‍යාපාරයේදී ප්‍රමුඛ කාර්යයක් ඉටු කළේය. ටී. ඩී. ඇස්. අමරසූරිය, ගාල්ලේ මහින්ද විදුහලේ අරමුදලට ආධාර කළ ප්‍රධානියා මෙන් ම ප්‍රධාන අරක්කු රේන්දකරුවෙකි. පසුකාලීනව මෙම තත්ත්වයන් අමද්‍යප සටනට බාධාකාරී බව හඳුනාගත හැකි ය. මෙයට විරුද්ධව නීති රීති සම්පාදනය කිරීම සිදු කිරීම දේශපාලනික ලෙස ආන්දෝලනාත්මක වූ අතර, එය ආණ්ඩු පෙරළියකට වුව ද හේතු විය හැකි විය.